**03-04-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පියා මෙන්ම දයාවන්ත වී, තව බොහෝ දෙනෙකුට මෙම මාවත පෙන්වන්න. නිර්භීත අය වන්නේ, දිව්‍ය රැයේ සේවයේ කාර්ය බහුලව සිටින දරුවන්ය.

**ප්‍රශ්නය:** ඔබගේ භාග්‍යය උසස් කර ගැනීමේ ප්‍රධානතම පදනම වන්නේ කුමක්ද?

**පිළිතුර:** සිහිපත් කිරීමේ වන්දනාව. ඔබ සිහිපත් කිරීමේ සිටින පමණට, ඔබගේ භාග්‍යය ඔබ ශ්‍රේෂ්ඨ කරගනී. ඔබගේ සිරුරේ ජීවිකාව වෙනුවෙන් ඔබ සෑම දෙයක්ම කරන අතර, පියා සහ ඔබගේ උරුමය අඛණ්ඩව සිහිපත් කරන්න, එවිට ඔබගේ භාග්‍යය නොකඩවා ශ්‍රේෂ්ඨ වනු ඇත.

**ගීතය:** මගේ භාග්‍යය අවදි කර, මම ආවෙමි.

ඕම් ශාන්ති. දරුවන් උපදින විට, ඔවුන්ගේ කර්මයට අනුව ඔවුන්ගේ භාග්‍යය රැගෙන එයි. ඇතැම් අය ධනවත් දෙමව්පියන්ට දාව උපත ලබන අතර, වෙනත් අය දුප්පත් දෙමාපියන්ට දාව උපත ලබයි. උරුමකරුවෙක් පැමිණ ඇති බව, පියා වටහාගනී. සෑම කෙනෙක්ම උපත ලබන්නේ, ඔහු කෙතරම් දන්දී, කෙතරම් පුණ්‍යකර්ම සිදුකර තිබේද, එයට අනුවය. පියා නැවත වතාවක් චක්‍රයකට පසුව පැමිණ, ඔය මිහිරිතම, ආදරණීය, බොහෝ කලක් නැතිව සිට දැන් හමුවූ දරුවන්ට විස්තර කරයි. ඔබත් සමඟ ඔබ ඔබගේ භාග්‍යය ගෙනැවිත් තිබෙන බව, ඔය දරුවන්ද දන්නවා. ඔබ දිව්‍ය ලෝකයේ ආධිපත්‍යයේ භාග්‍යය ඔබත් සමඟ රැගෙනවිත් තිබේ. මෙය බලපාන්නේ, මෙය ඉතා පැහැදිලිව වටහාගන්නා සහ පියාව සිහි කරන අයටයි. සිහි කිරීම සමඟ, වාසනාව සම්බන්ධයි. ඔබ උපතක් ගෙන ඇත, එබැවින් පියාගේ සිහි කිරීම තිබිය යුතුයි. සිහි කිරීම වැඩි වන තරමට ඔබගේ වාසනාව වඩාත් උසස් වෙයි. එය බොහෝ පහසු කරුණකි! ඔබට තත්පරයකදී ජීවන-මුක්තිය ලැබෙයි. සතුටු දේශයේ ඔබගේ වාසනාව ලබාගැනීමට, ඔබ පැමිණ සිටියි. ඔය සෑම කෙනෙක්ම දැන් උත්සාහ දරමින් සිටිනවා. ඔබ උත්සාහ දරන්නේ කෙසේද කියා, ඔය සෑම කෙනෙකුටම තමන් දෙස බැලිය හැක. මම්මා, බාබා සහ සේවය කරන දරුවන් උත්සාහ දරන ආකාරයට, ඔබත් ඔවුන් අනුගමනය කළ යුතුයි. සෑම කෙනෙකුටම පියාගේ හැඳින්වීම ලබා දෙන්න. ඔබ පියාගේ හැඳින්වීම ලබා දෙන විට, නිර්මාණයේ ආරම්භය, මැද සහ අවසානය පිළිබඳ හැඳින්වීම ද එයට ඇතුලත් විය යුතුයි. නිර්මාණකරු හෝ නිර්මාණයේ මුල, මැද සහ අවසානය පිළිබඳ දැනුම, කිසිම ඍෂිවරයෙකුට හෝ මුනිවරයෙකුට ලබා දිය නොහැක. මුළු චක්‍රයම පිළිබඳ අවධානය දැන් ඔබගේ බුද්ධිය තුළ තිබේ. ලෝකයේ කිසිම කෙනෙක් පියා හෝ උරුමය පිළිබඳව නොදනී. ඔය දරුවන් දැන් පියාව සහ ඔබගේ භාග්‍යය දන්නවා. ඔබ දැන් පියා සිහි කළ යුතුයි. ඔබගේ සිරුරේ ජීවිකාව වෙනුවෙන් ඔබ නිසැකයෙන්ම ක්‍රියා සිදු කළ යුතුයි. ඒ සමඟම ඔබගේ ගේදොරද ඔබ රැක බලා ගත යුතුයි. බන්ධන වලින් නිදහස් ඕනෑම කෙනෙකුට ඉතා හොඳින් සේවය කළ හැක. දරුවන් නොමැති අයට සේවය කිරීමට ඉතා හොඳ අවස්ථාවක් තිබේ. එසේ නැත්නම් ස්ත්‍රියකට ඇගේ ස්වාමියා සහ දරුවන්ගේ බන්ධන තිබේ. ඇයට දරුවන් නොමැති නම්, ඇය බන්ධන වලින් නිදහස්ය එය, විශ්‍රාමික ස්ථිතියේ ඇය සිටීමයි. එවිට, විමුක්ති දේශයට යාමට සමාගමක් අවශ්‍යයි. භක්ති මාර්ගයේදී ඔවුන් පූජකයන් ආදීන්ගේ සහ හුදකලා මාර්ගයේ අයගේ ඇසුර අරගනී. හුදකලා මාවතේ අයට, ගෘහස්ථ මාවතේ උරුමය හිමි කරගැනීමට, කිසිවෙකුට මඟ පෑදිය නොහැක. මිනිසුන්ට එය ලබා ගැනීමට මඟ පෑදිය හැක්කේ, ඔය දරුවන්ට පමණයි. පියා ඔබට මාර්ගය පෙන්වා ඇත. අසුන් ගෙන, භාරතයේ ඉතිහාසය සහ භූගෝලය සහ උපත් 84 ගැන කියා දෙන්න. උපත් 84ක් ගන්නේ භාරතයේ ජනතාව පමණයි. එය එක්කෙනෙක් පමණක් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. සූර්ය රාජවංශයට අයත් අය, ඉන්පසුව චන්ද්‍ර රාජවංශයටත්, පසුව වෛශ්‍ය රාජවංශයටත් යයි එය අංක පිළිවෙලයි. ඔවුන් තොටිල්ලක නලවන, භාරතයේ අංක එකේ රාජ කුමාරයා, ශ්‍රී ක්‍රිෂ්ණාය. ඔවුන් අංක දෙක නලවන්නේ නැත, මන්ද අංශක අඩු වී ඇති බැවින්. අංක එක, වන්දනාවට ලක් වෙයි. එක් ක්‍රිෂ්ණා කෙනෙක්ද, දෙදෙනෙක් හෝ තුන් ් දෙනෙක් සිටියිද කියා, මිනිසුන්ට වැටහෙන්නේ නැත. ක්‍රිෂ්ණාගේ රාජවංශය ඇති බව, කිසිවෙකු නොදනී. වන්දනා කෙරෙන්නේ අංක එක පමණයි. අංක පිළිවෙලට ලකුණු ලැබෙයි. එබැවින් උත්සාහ දැරිය යුතුයි මම අංක එක හිමි කර නොගන්නේ මන්ද? මම්මා සහ බාබා අනුගමනය කර, ඔවුන්ගේ රාජධානිය හිමි කරගන්න. හොඳින් සේවය කරන අය, හොඳ නිවසක අධිරාජවරයෙකුට දාව උපත ලබයි. එහි සිටින්නේ අධිරාජවරුන් සහ අධිරාජිනියන් පමණයි. එකල, රජ හෝ රැජින වැනි නම්බු නාම නැත ඒවා පවතින්නේ පසුවයි. තඹ යුගයේදී ඔවුන් අපවිත්‍ර වන විට, විශාල වශයෙන් දේපළ තිබෙන අය, රජු

යන නම්බු නාමය ගනී. අධිරාජවරයෙකුගේ තත්ත්වය අඩුවෙයි එය අතුරුදහන් වෙයි. භක්ති මාර්ගය ආරම්භ වන විට, ධනවත් අය සහ දුප්පත් අය අතර වෙනසක් තිබෙයි. දැන් ශිව බාබා සිහි කර, ඔහුගෙන් ඔබගේ උරුමය හිමි කරගන්නේ ඔය දරුවන් පමණයි. වෙනත් ආධ්‍යාත්මික හමුවීම් වලදී මිනිසුන් අසුන්ගෙන, ආගමික කතාපුවත් කියා දෙයි. මනුෂ්‍යයන්, මනුෂ්‍යයන්ට උගන්වන්නේ භක්තිය පමණයි ඔවුන්ට දැනුම ලබාදීමට හෝ විමුක්තිය ලබා දීමටවත් නොහැක. වේද, ග්‍රන්ථ ආදිය අයත් වන්නේ භක්ති මාර්ගයටයි. විමුක්තිය තිබෙන්නේ දැනුම තුළින් පමණයි. මිනිසුන් පුනර්භව ගැන විශ්වාස කරති. කිසිම කෙනෙකුට අතරමැදදී, ආපසු නිවසට යාමට නොහැක. පියා පැමිණ, සෑම කෙනෙක්ව ආපසු නිවසට රැගෙන යන්නේ අවසානයේදී පමණයි. ඒ සියලුම ජීවාත්ම ගොස් වාසය කරන්නේ කොහේද? සෑම ආගමකටම, එයටම අයත් කොටසක් තිබේ. මෙයත් විස්තර කල යුතුයි. ජීවයන්ගේ වෘක්ෂයක්ද තිබෙන බව, කිසිවෙකු නොදනී. මුළු වෘක්ෂයේම දැනුම, ඔය දරුවන්ගේ බුද්ධිය තුළ තිබේ. ජීවාත්මයන්ගේ වෘක්ෂයක් මෙන්ම ජීවමාන මානවයන්ගේ වෘක්ෂයක්ද තිබේ. ඔබගේ පැරණි සිරුරු හළා දමා ඔබ ආපසු නිවසට යන බව, ඔය දරුවන් දන්නවා. තමන් ශරීරයෙන් වෙන්ව සිටින බව සැලකීම යනු ජීවමානව මියැදීමයි. ඔබ මිය ගිය විට, ඔබට ලෝකය මිය ගොසින්ය. එවිට ඔබ, ඔබගේ සියලුම නෑදෑ මිතුරන් ආදිය හැරදා යයි. ඔබ පළමුව සම්පූර්ණ ඉගෙනුම ලබා ගෙන, තත්ත්වයකට හිමිකමක් ලබා ගනී, ඉන්පසුව ඔබ ආපසු නිවහනට යා යුතුයි. පරමාත්ම පියා සිහිපත් කිරීම ඉතාමත්ම පහසුය. කෙනෙක් අසනීපයෙන් සිටියත්, ඔබ දිගින් දිගටම ඔහුට කිව යුත්තේ ශිව බාබාව සිහිපත් කරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වෙයි. ස්ථිර යෝගීන් වන අය, විගසින් මිය යාම හොඳ නැත, මන්ද ඔවුන් යෝගාවේ සිටින විට, ආධ්‍යාත්මික සේවයේ යෙදී සිටින බැවින්. ඔවුන් මිය යන්නේ නම්, ඔවුන්ට සේවය කිරීමට නොහැකි වෙයි. සේවය කිරීමෙන්, ඔබ අඛණ්ඩව ඔබගේ තත්ත්වය උසස් කරගන්නා අතර, ඔබගේ සහෝදර සහෝදරියන්ට සේවය කිරීමටද ඔබට හැකි වෙයි. පියාගෙන් ඔබගේ උරුමයද ඔබට හිමි වෙයි. අපි සහෝදරයන්ය, එකම පියාගේ දරුවන්. පරම පියා පවසන්නේ මා සිහි කරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වී යයි. ඔහු මෙය පෙරද කීවේය. ඔබට ඕනෑම කෙනෙකුට විස්තර කළ හැක සහෝදර සහෝදරියනි, ජීවාත්ම වන ඔබලා, තමෝප්‍රධාන් වී සිටියි. ඔබ සතෝප්‍රධාන්ව සිටි අතර ඔබ දැන් තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වී, සතෝප්‍රධාන් ලෝකයට යා යුතුයි. සිහිපත් කිරීමේ වන්දනාව තුළින් ජීවාත්මය, සතෝප්‍රධාන් කළ යුතුයි. ඔබ නිවැරදි සිහි කිරීමේ වාර්තාවක් තබාගත යුතුයි. ඔබට දැනුමේ වාර්තාවක් තබා ගැනීමට නොහැකි වෙයි. පියා ඔබට දිගටම දැනුම ලබා දෙයි. ඔබ මත තිබෙන පාප බර ඉවත් කරගන්නේ කෙසේද කියා, ඔබ පරීක්ෂා කළ යුතුයි. සිහිපත් කිරීමේ වාර්තාවක් තබාගන්නේ මේ නිසාය. මා පැය කීයක් සිහි කිරීමේ සිටියාද? ඔබ අශාරීරික ලෝකය සිහි කරන අතර ඔබ නව ලෝකයද සිහිපත් කරයි. කැලඹීම් පැමිණිය යුතුයි. ඒ සඳහා සූදානම් සිදුවෙමින් පවතිනවා ඔවුන් අඛණ්ඩව බෝම්බ නිපදවනවා. එක් අතකින් මරණය ගෙන ඒමට ඔවුන් උපකරණ නිපදවන බව පවසයි. අනෙක් අතින් ඔවුන් පවසන්නේ මරණය වෙනුවෙන් කිසිවක් නිපදවන්න එපා. ඔවුන්ට මුහුද යට පවා මාරාන්තික දේවල් තිබේ. ඔවුන් මුහුද යටින් ඉහළට පැමිණ (සබ්මැරීන වලින්) බෝම්බ මුදා, නැවතත් මුහුද යටට යනු ඇත. ඔවුන් දිගින් දිගටම එවන් දේවල් නිපදවයි. ඔවුන් ඒ සෑම දෙයක්ම සිදු කරන්නේ ඔවුන්ගේම විනාශය සඳහාය. මරණය අත ළඟය. බොහෝ විශාල මාලිගා ගොඩනැඟෙමින් පවතිනවා. ඒ සියල්ලම දූහුවිලි බවට හැරෙන බව, ඔබ දන්නවා. ඇතැම් අයගේ ධනය, පොළව යට වැළලී තිබෙයි.... යුද්ධය අනිවාර්යෙන්ම සිදුවෙයි. ඔවුන්, සෑම කෙනෙකුගේම සාක්කු හිස් කිරීමට උත්සාහ දරයි. බොහෝ සොරුන් එහි යයි. ඔවුන් යුද්ධ වෙනුවෙන් විශාල ලෙසින් වියදම් කරයි. ඒ සියල්ල දූවිලි බවට හැරීමටයි යන්නේ. සියලුම ගොඩනැගිලි ආදිය වැටෙයි. බෝම්බ ආදිය හෙලූ විට, ලෝකයෙන් හතරෙන් තුනක් විනාශ වෙයි. හතරෙන් එකක් පමණක් ඉතිරි වෙයි. භාරතය තිබෙන්නේ හතරෙන් එක් කොටසක නොවේද? අන් සියල්ලෙහි පැවතීම ආරම්භ වූයේ පසුවයි. භාරත කොටස පමණක් ඉතිරි වෙයි. සෑම කෙනෙක්ම මිය යයි. එබැවින් අපි පියාගෙන් අපගේ මුළු උරුමයම හිමි කර නොගන්නේ මන්ද? මේ නිසයි පියා පවසන්නේ ඔබගේ ලෞකික නෑදෑයින්ටත් ඔබගේ වගකීම් ඉටු කළ යුතුයි. ඔබට බන්දන නොමැති නම්, බාබා ඔබට මෙසේ අවවාද කරයි ඔබ සේවයේ කාර්ය බහුල නොවන්නේ ඇයි? ඔබ නිදහස් බැවින් ඔබට බොහෝ දෙනෙකුට සෙත සැලසිය හැක. හොඳයි, ඔබට පිටත කොහේවත් නොයා සිටිය හැක. අඩු තරමින් ඔබගේ නෑදෑ මිතුරන්ටවත් ඔබ අනුකම්පා කළ යුතුයි! පෙරකල ඔබ මෙසේ කීහ බාබා, අනුකම්පා කරන්න! ඔබට දැන් මාවත පෙන්වා දී ඇත. එබැවින් පියා තුළ දයාව තිබෙන සේම ඔබ තුළද අන් අය කෙරෙහි දයාව තිබිය යුතුයි. පියා පවසන්නේ මා සිහි කරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වෙයි. සන්‍යාසීන් හත යෝගා කරමින් බොහෝ උත්සාහ දරයි. මෙහි, ඔබ ඒ කිසිවක් කළ යුතු නැහැ. ඔබ කළ යුත්තේ ඔබගේ පාපයන් පුළුස්සා දැමීම සඳහා, සිහිපත් කිරීමේ සිටීම පමණයි. මෙහි අපහසුතාවයක් නැත. එය

සිහිපත් කිරීමේ වන්දනාවේ සිටීමේ කරුණ පමණයි. ඔබ අසුන් ගන්න විට, ඇවිදින විට, එහෙ මෙහෙ ගමන් කරන විට ඔබ ඒ සෑම දෙයක්ම කරන්නේ ඔබගේ භෞතික ඉන්ද්‍රියන් වලිනි, නමුත් ඔබගේ බුද්ධිය, ඔබ පියාට යෝගාවෙන් සම්බන්ධ කරගනී. එම ආදරවන්තයාගේ සත්‍ය ආදරවන්තියක් වන්න. ඔහුම පවසන්නේ අහෝ ආදරවන්තයිනි! අහෝ දරුවනි! භක්ති මාර්ගයේදී ඔබ බොහෝ සේ මා සිහි කළා. දැන් මා සිහි කරන්න, එවිට ඔබගේ පාපයන් පිළිස්සී යයි. මා මෙය සහතික කරනවා. මෙම සමහර දේවල් ග්‍රන්ථ වල සඳහන් කර ඇත. දෙවියන්ගෙන් ගීතාවට සවන් දීමෙන් ඔබට ජීවන-මුක්තිය ලැබෙයි. මනුෂ්‍යයන්ගෙන් ගීතාවට සවන් දීමෙන් ඔබ බන්ධන දිවියකට ඇතුළු වී ඇත. ඔබ නොකඩවා ඉනිමඟ දිගේ පහළට පැමිණියා. ඔබ සෑම දෙයක් පිළිබඳව, දැනුමේ මහා සයුර කැලතිය යුතුයි. ඔබගේ බුද්ධිය භාවිත කරන්න! මෙය, එය තුළින් ඔබගේ පාපයන් පිළිස්සී යන, බුද්ධියේ වන්දනා ගමනයි. වේද, ග්‍රන්ථ හැදෑරීමෙන්, තපස් රැකීමෙන් හෝ යාග හෝම පැවැත්වීමෙන් පාපයන් දුරු වන්නේ නැත. ඔබ පහළට පැමිණෙන අතර ඔබ දැන් ඉහළට යා යුතුයි. කෙනෙක් එය විස්තර නොකළේ නම්, ඉණිමඟෙහි පිංතූරයෙන් පමණක් කිසිවෙකුට එය වටහාගැනීමට නොහැකි වනු ඇත. කුඩා දරුවන්ට පිංතූර පෙන්වා ඔබ උගන්වන ආකාරයෙන් - මේ ඇතෙකි, එවිට ඔහු ඇතෙක් දුටු විට, ඔහුට එම පිංතූරය මතක් වෙයි - ඒ අන්දමින්ම මෙය ඔබගේ බුද්ධියට ඇතුළු වෙයි. පිංතූර සෑම විටෙකම කුඩාය. පාරාදීසය බොහෝ විශාල වන බව ඔබ දන්නවා. එහි විශාල රාජධානියක් තිබෙයි. එහි දියමන්ති සහ මැණික් මාලිගා තිබෙයි. පසුව ඒ සෑම දෙයක්ම අතුරුදහන් වෙයි සියල්ල අතුරුදහන් වී යයි. එසේ නැත්නම් මෙම භාරතය දුප්පත් වන්නේ කෙසේද? දුප්පත් බවින් එය ධනවත් විය යුතු අතර ධනවත් බවින් එය දුප්පත් විය යුතුයි. මෙම නාටකය පෙර නියමිත වී තිබේ. ඉණිමඟේ පිංතූරය විස්තර කෙරෙන්නේ මේ නිසාය. පැමිණෙන අළුත් අයට විස්තර කිරීමෙන්, ඔබ එම පුරුද්ද වර්ධනය කරගන්නා අතර, එවිට ඔබගේ කටවල් ඇරෙයි. දරුවන් සේවය කිරීමට සුදුස්සන් බවට පත් කෙරෙයි. බොහෝ මධ්‍යස්ථාන වල දරුවන් බොහෝ සේ අසාමය පතුරුවයි. ඔවුන්ගේ බුද්ධියේ යෝගාව පිටත සැරි සරන විට, ඔවුන් හානියක් සිදුකර, වාතාවරණය නරක් කරයි. එය අංකානුරූපයි. එබැවින් පියා මෙසේ කියනු ඇත ඔබ ඉගෙනගත්තේ නැහැ, එබැවින් දැන් ඔබගේ තත්ත්වය කුමක් වී ඇත්දැයි බලන්න! දිනෙන් දින ඔබට වැඩි වැඩියෙන් දර්ශන ලැබෙයි. පාපයන් සිදු කරන අය දිගටම දඬුවම් විඳියි. එවිට ඔවුන් මෙසේ කියයි මා හේතුවක් නැතිව පාපයන් සිදු කළා. ඔබ පියාට පවසා, පසුතැවිලි වූ විට, එය ටිකක් අඩු කර ගත හැක. එසේ නැත්නම් එය එන්න එන්නම වැඩිවෙයි. මෙය අඛණ්ඩව සිදුවෙයි. එවිට ඔබටම එය දැනී ඔබ මෙසේ කියනු ඇත මා කුමක් කරන්නද? මගේ මෙම පුරුද්ද අවසන් වන්නේ නැත. එබැවින් ගොස් නිවසේ ජීවත් වීම ඊට වඩා හොඳය. ඇතැමුන් ඉතා හොඳ සේවයක් කරයි. සමහරුන් අවැඩක්ද සිදුකරයි. පියා මෙතැන අසුන් ගෙන ඔහුගේ සේනාවේ එඩිතර සහ නිර්භීත අයගේ නම් ඔබට ලබා දෙයි. මෙහි යුද්ධයක් ආදිය පිළිබඳ ප්‍රශ්නයක් නැත. මේවා අසීමිත කරුණුය. හොඳ දරුවන්ට පියා නිසැකයෙන්ම ප්‍රශංසා කරයි. ඔය දරුවන් බොහෝ දයාවන්ත මෙන්ම හිතකාමී විය යුතුයි. අන්ධයින්ට සැරයටියක් වන්න. සෑම කෙනෙකුටම මාවත පෙන්වන්න පියා සිහි කරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වෙයි. මෙසේ කියයි පාප ආත්මය සහ පුණ්‍ය ආත්මය. ඒ කෙනා තුළ උත්තරීතර පියා අසුන් ගෙන සිටින්නේවත්, ජීවයක් උත්තරීතර ජීවාත්මය වන්නේවත් නැත. ඒ සියල්ල වැරදියි. උත්තරීතර ජීවාත්මයට කිසිම පාපයක් රැස් කරගත නොහැක. ඔහුට නාටකයේ, සේවය කිරීමේ කොටස තිබෙයි. පාප ආත්ම සහ පුණ්‍ය ආත්ම වන්නේ මනුෂ්‍යයන්ය. සතෝප්‍රධාන්ව සිටි අය, තමෝප්‍රධාන් වී ඇත. පරම පියා මෙම කෙනාගේ සිරුර තුළ අසුන්ගෙන, ඔබව සතෝප්‍රධාන් කරවයි, එබැවින් ඔබ ඔහුගේ උපදෙස් පිළිපැදිය යුතුයි. පියා දැන් ඔබගේ බුද්ධි බොහෝ පුළුල් සහ අසීමිත කර තිබේ. රාජධානිය ස්ථාපනය වන බව ඔබ දැන් දන්නවා. පියා, බ්‍රහ්මගේ ශරීරය තුළට ඇතුළු වී, බ්‍රහ්මගේ මුඛයෙන් උපන් නිර්මාණය වන ඔබට, රාජයෝගාව උගන්වා, ඔබව දේවතාවන් බවට පත් කරවයි. ඉන්පසුව ඔබ පුනර්භව ගෙන, ඉණිමඟ දිගේ පහළට එයි. ඒ සියල්ල දැන් ඒ අන්දමින්ම නැවත සිදු විය යුතුයි. පියා නැවත වතාවක් බ්‍රහ්මගේ මාර්ගයෙන් ස්ථාපනය සිදුකරනවා. ඔබ යෝගා බලයෙන් පාපයන් පහ ජයගෙන, ලෝකය ජයගත්තන් වෙයි. යුද්ධයක් ආදිය පිළිබඳ ප්‍රශ්නයක් නැත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. බන්ධන වලින් නිදහස් වී, පියාගේ සේවයේ තමන්ව කාර්ය බහුල කරගන්න. ඔබ, ඔබගේ වාසනාව උසස් කරගන්නේ එවිට පමණයි. දයාවන්ත වී, තව බොහෝ දෙනෙකුට මාවත පෙන්වන්න. අන්ධයින්ට සැරයටියක් වන්න.
2. ඔබගේ සිරුරෙන් සියලු බැඳීම් ඉවත් කර, ජීවමානව මිය යන්න, මන්ද ඔබ දැන් ආපසු නිවසට යා යුතුයි. ඔබ රෝගීව සිටියත්, ඒකායන පියාව පමණක් සිහිපත් කරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වී යයි.

**වරදානය:** ඔබගේ හිතකාමී හැඟීම් වලින් සියළු ජීවාත්මයන්ගේ සංස්කාර පරිවර්ථනය කිරීම සඳහා ඔබගේ බුද්ධිය විශ්වාසයෙන් පිරෙත්වා.

ඔබගේ බුද්ධියේ පරම පියා පිළිබඳව 100% විශ්වාසය තිබේ, එබැවින් අන් අය කෙතරම් ඔබව චංචල කිරීමට තැත් කළත් ඔවුන්ට එය කළ නොහැක. ඒ ආකාරයෙන්ම, දිව්‍යමය පවුලේ හෝ ලෞකික සමාජයේ ජීවාත්ම ඔබට කෙතරම් පරීක්ෂණ පත්‍ර ලබා දුන්නත්, ඔවුන් කෝපයට පත් වී ඔබට විරුද්ධ වුනත්, අපහාස හෝ නින්දා කළත් ඔවුන්ට ඔබව චංචල කළ නොහැක. මේ සඳහා සරලව සියළු ජීවාත්ම වෙත හිතකාමී හැඟීම් ඇති කරගන්න, එවිට මෙම හැඟීම් ඔවුන්ගේ සංස්කාර පරිවර්ථනය කරයි. මෙහිදී ඔබ නොඉවසිලිවන්ත නොවිය යුතුයි. නිසි වෙලාවට අනිවාර්යෙන් ඵල ලැබෙයි: මෙය නාටකයේ නියම වී තිබේ.

**පාඨය:** ඔබගේ දුර්වලතා අවසන් කිරීම සඳහා, සිතිවිලි පිරිසිදු, පිවිතුරු සහ මෙම දැනුමින් පිරිපුන් කිරීමට, පාරිශුද්ධත්වයේ බලය භාවිතා කරන්න.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨත්වයට පත් වීමට මිහිරිබව සහ නිරහංකාරකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

ඔබගේ වදන් වල නිරතුරුවම සත්‍යය සහ මධුරබව තිබිය යුතුයි, එවිට ඔබ අඛණ්ඩව ඔබගේ වදන් වලින් ලකුණු රැස් කරගනී. ඔබගේ දිවියේ මිහිරිබව යන ගුණදහම තිබෙන විට, ඔබ පවසන සෑම වදනක්ම මුතු කැටයක් මෙන් වෙයි. ඔබ කතා කරනවා නොව, මුතු කැට ඉසින්නාක් මෙන් දැනෙයි. ඔබ කෙබඳු වදන් පවසන්නේද යත්, ඒවාට සවන් දෙන අයට මෙසේ හැගෙයි: මාද එවන් වදන් පැවසිය යුතුයි. ඒවා ඇසෙන සෑම කෙනෙකුටම ඔබව අනුගමනය කර, ඔවුන්ද එසේ කිරීමට ඉගෙන ගැනීමට දිරිගැන්වෙයි. එවන් මධුර වදන් වල කම්පන තරංග, අන් අයව ඉබේටම ඔබ වෙතට ආකර්ෂණය කරයි.